# අක්ෂර රූප විකාශය

ආර්.එම්.එන්. ලක්මාලි[*], බී.ජී.ආර්. වසන්ති[**]

භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
[*]nadee.np27@gmail.com, [**]rwboogoda122rusl@gmail.com

**ප්‍රමුඛ පද:** සිංහල අක්ෂර මාලාව විකාශය, අක්ෂර විකාශය, සිංහල, පරිගණක අක්ෂර රූප, පෘෂ්ටීය ස්වභාවය

## හැඳින්වීම

අක්ෂර යනු සන්නිවේදන මාධ්‍යයක් වන අතර සංකේතානුසාරයෙන් දැක්වෙන මේවා ශබ්ද පදනම් කරගෙන හෝ වස්තූන් සංසිද්ධි ආදිය පදනම් කරගෙන නිරූපනය වී තිබේ. අක්ෂර වල අවශ්‍යයතාවය ලොව හමුවේ පැවතිනුයේ සමාජ පරිණාමයත් සමඟිනි. මිනිසා ක්‍රම ක්‍රමයෙන් තම දැනුම අනුසාරයෙන් අත්කරගත් පරිල්පනයේ ක්‍රමික දියුණුවත් සමඟ භාෂා ව්‍යවහාරයෙන් පරිභාහිර වූ සංකේතානුසරයෙන් සිදුකළ අදහස් ප්‍රකාශනයේ කලාවක් ලෙස අක්ෂර හඳුනාගත හැකි ය. අක්ෂර යුග ගණනාවක විකාශය විය. ඒ අනුව අක්ෂර රූප විකාශයට විවිධ හේතූන් බලපා තිබේ. ලේඛන ගතවන මාධ්‍යයේ පෘෂ්ටීය ස්වභාවය අනුව, ඒ අක්ෂර සටහන් කළ ශිල්පියාගේ සාක්ෂරතාවය මත, ප්‍රදේශානුබද්ධ ව දක්වන සුවිශේෂතා මත සහ ශිල්පීය දක්ෂතාව විවිධ විෂමතාවයන්ට බඳුන් වී ඇත.

වර්තමානයේ දක්නට ලැබෙන අක්ෂරයන්ගේ ආරම්භය ක්‍රි.පූ තුන්වන සියවස දක්වා විහිදේ. පසුව අපර බ්‍රාහ්මී යුගය, පශ්චත්කාලීන යුගයන්හි අක්ෂර විකාශය විය. ආරම්භය ස්ථිර ලෙස කිව නොහැකි වන්නේ ලේඛන සටහන් වූ මාධ්‍ය අතුරින් අද වනවිට ශේෂ වී පවතින්නේ මැටි බඳුන්, ශිලා පෘෂ්ට ආදී ජීර්ණය අවම සීඝ්‍රතාවක පවතින මාධ්‍යයන් පමණක් වන බැවිනි.

සමාජයේ පවතින ඕනෑම අවස්ථාවකට වර්ධනීය තත්ත්වයක් ඇත. ඒ අනුව අක්ෂරවල උපයුක්තාවයත් සමඟ අක්ෂර කලාව ද වර්ධනය වූ ආකාරයක් වෙති. මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමඟ අක්ෂර විකාශයේ ගමන්මග ස්ථාවර තත්ත්වයකට පත්විය. අක්ෂරවල ස්වරූපය ස්ථාවර තත්ත්වයකට පත් වුවද අද වන විටත් අක්ෂර වල හැඩය වෙනස් වෙමින් පවතී. ඒ අනුව අක්ෂර විකාශයේ ගමන් මඟ තවමත් ස්ථාවර තත්ත්වයක නොමැති බව කිව හැකි ය. අක්ෂර රූප විකාශය තව දුරටත් සිදු වන බව නූතන පරිගණක ආශ්‍රිත අක්ෂර අනුව අපට හඳුනාගත හැකි ය.

## ක්‍රමවේදය

ද්විතීයික මූලාශ්‍ර ලෙස මෙම මාතෘකාව සම්බන්ධව ලියවී ඇති පොත්පත් මෙන් ම පර්යේෂණ ආදිය තුළින් ලබාගත් දත්ත ද විද්‍යුත් මාධ්‍ය තුළින් ලබාගත් තොරතුරු ද උපයෝගී කරගන්නා ලදී. සිංහල අක්ෂර රූප විකාශයේ අවධීන් හඳුනාගැනීම සහ විවිධ හේතූන් පදනම් කරගෙන අක්ෂර වල හැඩය පරිණාමය තවමත් සිදු වන අයුරු හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

නූතන සිංහල අක්ෂර මාලාවේ බිහිවීමේදී එය ක්‍රමික විකාශයක ප්‍රතිඵලයක් ලෙස පෙන්වාදිය හැකිය. අක්ෂර රූප විකාශනයේදී බලපාන සාධක ලෙස මාධ්‍යයේ ප්‍රෘෂ්ටීය ස්වභාවය අනුව, ඒ අක්ෂර සටහන් කළ ශිල්පියාගේ සාක්ෂරතාවය මත, ප්‍රදේශානුබද්ධ ව දක්වන සුවිශේෂතා මත සහ ශිල්පීය දක්ෂතාව මත මෙම අක්ෂර සටහන් යම් යම් ආකාරයේ විෂමතාවයන්ට බඳුන් වී ඇත.

අක්ෂර විකාශය ප්‍රධාන යුග තුනකට බෙදේ.
පූර්ව බ්‍රාහ්මී යුගය
අපර බ්‍රාහ්මී යුගය
පශ්චාත් කාලීන යුගය

පූර්ව බ්‍රාහ්මී යුගය ක්‍රි.පූ තුන්වැනි සිවසේ සිට ක්‍රි.ව පළමුවැනි සියවස දක්වා දිවේ. මෙහි අක්ෂර විකාශයේදී බ්‍රාහ්මී අක්ෂර යෙදී ඇතත් ලංකාවට ආවේනික වූ ශෛලියක් දක්නට ඇත. මෙම යුගයේ අක්ෂර වල ලක්ෂණ නම් කේවල දීර්ඝස්වර හෝ ව්‍යඤ්ජනාශ්‍රිත දීර්ඝස්වර දක්නට නැති වීම, සංයුක්තාක්ෂර හෝ මහා ප්‍රාණාක්ෂර ද විරල වීම, අනුස්වාරය ද නැති වීම, අ, ත, ම, ය, ර යන අක්ෂර විවිධ හැඩයෙන් කොටා තිබීම ආදීයයි.

ක්‍රි.ව 1 වැනි හා 2 වැනි සියවස් තුළ අක්ෂර වෙනස් වීමේ යුගය අපර බ්‍රාහ්මී යුගය ලෙස හඳුන්වයි. අපර බ්‍රාහ්මීය යුගයට අයත් අක්ෂර විශේෂයක් ගිරි ලිපිවල දක්නට ලැබේ. මේවායේ විශේෂත්වය වන්නේ පර්වත හෝ කටාරමේ හැඩයට අනුව කෙටීමයි. මෙම යුගයේ අක්ෂරවල විශේෂ ලක්ෂණ නම් අකුරුවල සිරස් රේඛා මුදුනේ ඉහක් වැනි කෙටි හරස් ඉරක් ඇති වීම. සිරස් රේඛාවල පහල කොටස දීර්ඝ වී වමට නැවී යාම. ''ල ''යන්නෙහි දකුණු සිරස් රේඛාව පහලට දික් වී මුලදී දකුණටත් පසු ව වමටත් නැමී යාම. ''ඩ'','' ළ'' අක්ෂරවල පහළ කොටස් දකුණට විවෘතව වක් වී යෑම ''ව'', ''ම'' යන අකුරුවල වට කොටස් ත්‍රිකෝණාකාර හැඩයක් ගැනීම, ඇතැම් අකුරුවල අසමාන සිරස් රේඛා සම උසින් යුක්ත වීම, කෝණාකාර අකුරු වට හැඩයක් ගැනීම යනාදියයි.

ක්‍රි.ව 8 වැනි ශතකයේදී එනම් පශ්චාත් කාලීන යුගයේදී පමණ සිංහල යයි කිවහැකි අකුරු ක්‍රමයක් හැඩ ගැසුනි. ඒ හැඩ ගැස්ම සම්පූර්ණයෙන්ම අවසන් වූයේ 10 වැනි ශතකයේදී ය. මෙම යුගයේ අක්ෂරවල ලක්ෂණ නම් ''ඇ'' කාරය හා ඈකාරය හඟවන සංකේතයන් මුල් වරට ඇති වීම, සංයුක්තාක්ෂර බහුල ව යෙදී තිබීම ( සීගිරි ගී) යනාදියයි. විරාම ලක්ෂණ හමුවීම ද විශේෂ ලක්ෂණයකි.

අක්ෂර විකාශයේ අවසන් අවස්ථාව වන්නේ පොළොන්නරු යුගයයි. ඉංග්‍රීසි ආක්‍රමණයත් සමඟ මුද්‍රණ ශිල්පය හඳුන්වා දීමේදී පුස්කොළ හා පන්හිඳ වෙනුවට ඉතා පහසු උපකරණ භාවිතය හේතුවෙන් සිංහල අක්ෂරමාලාව ස්ථාවර ස්වරූපයක් ගත්අතර ඉන් පසු කාලීන ව සිංහලයේ සැලකිය යුතු විකාශයක් සිදු නොවුන බව ද සිංහල අක්ෂර අදවනවිට ස්ථාවර ස්වරූපයක පවතින බවත් කිව හැකි ය.

මෙම පර්යේෂණය ට අනුව වර්තමානයේ දී සිංහල අක්ෂරවල රවුම් හැඩැති අක්ෂර හැඩය ස්ථාවර තත්ත්වයක පැවතිය ද පරිගණක තාක්ෂණය ආරම්භවීමත් සමඟ සිංහල අක්ෂරවලට අදවනවිට විවිධ හැඩයන් ලැබී ඇති බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම පුද්ගලයාගෙන් පුද්ගලයාට, අවස්ථාවෙන් අවස්ථාවට අද වනවිට අක්ෂර විවිධ හැඩයන්ට පත්ව ඇති බව ද පෙන්වාදිය හැකි ය. පෙර පාසලේදී දරුවන් සිංහල හෝඩියේ අක්ෂර රවුම් ලෙස ඉගෙන ගත්ත ද පසු ව නොයෙක්

හේතූන් අනුව අක්ෂර වෙනස් ආකාරය ලිවීමට පටන් ගනී. කියවන විට ලියන අධ්‍යාපන ක්‍රමයේදී වේගය රඳවා ගැනීමේදී ක්‍රමයෙන් අක්ෂරවල හැඩය වෙනස් වේ. අක්ෂරවල හැඩය අනුව පමණක් නොව පිල්ලම්වල හැඩය ද අද වනවිට විවිධ හැඩ ගනී. ශාස්ත්‍රීය ලිපි ලේඛනවල පමණක් අදවනවිට රවුම් හැඩැති අකුරු භාවිත කරන අතර තාක්ෂණයේ දියුණුවත් සමග සිංහල අකුරු විවිධ හැඩයෙන් යුක්ත ව නිර්මාණය වී ඇත. වෙළඳ දැන්වීම් ක්ෂේත්‍රය තුළ මේ ලෙස අක්ෂරවල හැඩය බොහෝ සෙයින් වෙනස් වී ඇති ආකාරය පෙන්වාදිය හැකි ය. ඒ අනුව සිංහල අක්ෂර මාලාවට ස්ථාවර හැඩයක් (රවුම් හැඩය) තිබුණද නොයෙක් හේතූන් නිසා මෙම හැඩය වෙනස් වනබව කිවහැකිය. මේ අනුව සිංහල අක්ෂරවල විකාශනය අදවන විටත් සිදු වන බව පෙන්වාදිය හැකිය. මෙම පරිණාමය දිගින් දිගට ම විවිධ හේතූන්මත තවදුරටත් සිදුවන බව පෙන්වාදිය හැකි ය.

ඒ අනුව සිංහල අක්ෂර මාලාව දිගු කාලීන විකාශයක ප්‍රතිඵලයක් බවත් සිංහල අක්ෂරවල හැඩය විකාශනය වී ස්ථාවර ස්වරූපයකට පැමිණුනු බවත් නමුත් සිංහල අක්ෂරවල හැඩය තව දුරටත් වෙනස් වෙමින් පවතින බවත් මෙලෙස අක්ෂර විකාශනයට විවිධ හේතූන් බලපාන බවත් නිගමනය කළ හැකි ය.

සිංහල අක්ෂර මාලාවේ විකාශයේදී සිංහල අක්ෂර කෙරෙහි බ්‍රාහ්මීය අක්ෂර බලපාන ලදී. සිංහල අක්ෂර විකාශයේදී පූර්ව බ්‍රාහ්මී, අපර බ්‍රාහ්මී පශ්චාත් කාලීන ලෙස යුග ගණනාවක් තිස්සේ දිගුකාලීනව විකාශය වී සිංහල යයි කිවහැකි ස්ථාවර අක්ෂර හැඩයකට පත්වීය. අක්ෂර විකාශයට ලේඛන ගතවන මාධ්‍යයේ පෘෂ්ඨීය ස්වභාවය අනුව, ඒ අක්ෂර සටහන් කළ ශිල්පියාගේ සාක්ෂරතාවයමත, ප්‍රදේශානුබද්ධව දක්වන සුවිශේෂතාමත සහ ශිල්පීය දක්ෂතාව ආදී විවිධ හේතූන් බලපාන ලදී. මෙම හේතු සාධකවල බලපෑම අනුව අදවන විටත් සිංහල අක්ෂර මාලාව විකාශය වෙමින් පවතී.

## ආශ්‍රිත ග්‍රන්ථ


බලගල්ලේ, වී.ජී. (2010) ***සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය***. කොළඹ 10, ඇස් ගොඩගේ සහ ප්‍රකාශකයෝ.

පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ, මල්ලව ආරච්චි, නිමල් (2009) ***සිංහල භාෂා විකාශනය සහ ශිලා ලේඛන විමර්ශන***. මාධවී ප්‍රින්ටර්ස්, බුලුගහ හන්දිය, කැළණිය.

රාජපක්ෂ මංගලිකා (බදාදා අතිරේකය) *ශ්‍රී ලංකාවේ සෙල්ලිපිවල ආරම්භය හා විකාශය*, www.divaina.com (පරික්ෂා කළේ 2016.10.24)